12th Academic Sessions
University of Ruhuna, Matara, Sri Lanka

ISSN 2362-0412

# පුරාණ ලංකාවේ ස්වස්ථතාව හා සනීපාරක්ෂක ක්‍රමවේද සම්බන්ධයෙන් හමුවන පුරාවිද්‍යාත්මක සාධක (රජරට හා රෝහණ දේශය ඇසුරෙනි)

කේ.ඩී දිල්රුක්ෂි [a] සහ උපේක්ෂා ගමගේ [b]

[b] *ඉතිහාසය සහ පුරාවිද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර සහ සමාජයීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය*

[a] *kdadilrukshi89@gmail.com* [b] *upeksha_gamage@yahoo.com*

## සාරසංක්ෂේපය

මානවයාගේ පැවැත්මට වඩාත්ම වැදගත් වූ සංකල්පයක් වනුයේ තම ජීවිතය රෝග පීඩාවලින් තොරව පවත්වා ගැනීමයි. මානව ප්‍රජාව සතුව පවතින සව්ඥානික බව නිසාම මේ සඳහා ක්‍රියා කරනු ලබන ආකාරය වඩා වැදගත් වෙයි. පුරාණ ලාංකික ජනතාව ස්වස්ථතාව හා සනීපාරක්ෂක ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍යය සම්පන්නව ජීවත් වී ඇත. ස්වස්ථතාව හා සනීපාරක්ෂක ක්‍රමවේද සම්බන්ධයෙන් හමුවන පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යමය මූලාශ්‍ර මගින් උක්ත කරුණ සනාථ වෙයි. පරම සැපත නිරෝගිමත්ව ජීවත්වීම බව ධම්ම පදය තුළ බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. එසේම භික්ෂු සමාජයට සෞඛ්‍යය සම්පන්නව ජීවත්වීමට අවශ්‍යය වත්පිළිවෙත් චුල්ලවග්ග පාලිය, මහාවග්ග පාලිය, පාරාජිකා පාලිය ආදී වූ විනය පිටකයට අයත් ග්‍රන්ථ තුළ දේශනා කර ඇත. පුරාණ ලංකාවේ මුල්ම ජනාවාස ව්‍යාප්තවීමත් සමග සෞඛ්‍යය සංරක්ෂණ ක්‍රමවේදයන්හි අවශ්‍යතාව ලාංකික ජනතාවට ඇති විය. පුරාණ ලංකාවේ පාලකයන්ද ජනතාවට නිරෝගිමත්ව ජීවත්වීමට අවශ්‍යය පහසුකම් සලසා දුන්හ. IV වන කාශ්‍යප රජතුමාගේ කිරිබත් වෙහෙර ටැම් ලිපියේ වෛද්‍ය ශාලාවකට පරිත්‍යාග කරන ලද ඉඩමක් පිළිබඳව සඳහන් වෙයි. මිහින්තලා පුවරු ලිපියේ වෛද්‍යවරු ලැබූ වැටුප් පිළිබඳව සඳහන් කර ඇත. ස්වස්ථතාව හා සනීපාරක්ෂාව සම්බන්ධයෙන් හමුවන පුරාවිද්‍යාත්මක සාධක අතර රෝහල් හා ඒ ආශ්‍රයෙන් හමුවන බෙහෙත් ඔරු, ශල්‍ය වෛද්‍ය උපකරණ, ඇඹරුම් ගල්, බෙහෙත් ගබඩා කරන බඳුන්, බෙහෙත් කිරන තරාදි, ජන්තාඝර, වැසිකිළි, කැසිකිළි, අපවිත්‍ර ජලය පිටවන කාණු පද්ධති ආදිය වැදගත් වෙයි. වැසිකිළි කැසිකිළි ආශ්‍රයෙන් හමුවන පෙරහන් ක්‍රමය පරිසර හිතකාමී ක්‍රමවේදයකි. මෙම සාධක මගින් පුරාණ ලංකාවේ සෞඛ්‍යය සංරක්ෂණය සඳහා විවිධ ක්‍රම වේද අනුගමනය කරන ලද බව සඳහන් කළ හැකිය. ක්ෂේත්‍ර අධ්‍යයනය හා පුස්තකාල අධ්‍යයනය මගින් දත්ත රැස් කිරීම කරනු ලැබූ අතර, එමගින් පුරාණ ලාංකික ජනතාව ස්වස්ථතාව හා සනීපාරක්ෂාව රැක ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනය කෙරිණි.

***ප්‍රමුඛ පද:*** *පුරාවිද්‍යාව, සංරක්ෂණය, සනීපාරක්ෂාව, ස්වස්ථතාව, සෞඛ්‍යය*